සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

14 | S | I

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
# First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : ....................................... කතෝලික ධර්මය - I කාලය : පැය 03යි.

සැළකිය යුතුයි :

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

---

01. ශුද්ධ බයිබලයේ පොත් 46 කොටස් පහකට බෙදා දක්වන්නේ,
   1. එළිදරව් සාහිත්‍යයේ ය.
   2. පුරාණ ගිවිසුමේ ය.
   3. ප්‍රඥා සාහිත්‍යයේ ය.
   4. නව ගිවිසුමේ ය.

02. ජීවන සහා සම්ප්‍රදායෙන් අපට ලැබූ දේ තවදුරටත් පෝෂණය වන්නේ,
   1. කතෝලික සභාවේ මඟපෙන්වීමෙනි.
   2. අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම් මඟිනි.
   3. සභා සම්ප්‍රදාය මගිනි.
   4. ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආලෝකයෙනි.

03. ''ස්වාමීන් වහන්සේගේ වචනය සදහටම පවතී. ඒ වචනය නම් ඔබට දේශනා කරන ලද සුබ අස්නය'' මෙලෙස ප්‍රකාශ කළේ,
   1. ජොහාන් තුමා ය.
   2. පේදුරු තුමා ය.
   3. ජාකොබ් තුමා ය.
   4. තෝමස් තුමා ය.

04. A අපෝස්තලික යුගයේ ශුද්ධවූ සභාවට මහඟු සේවයක් කරන ලදී.
   B විවිධ සංඝවලට හා පුද්ගලයන්ට ලිපි ලියා ඇත.
   C නායකත්වය හා සංඝ සමඟ සබඳතා පැවැත්වූ ආකාරය පැහැදිලි වේ.
   ඉහත ප්‍රකාශනවලට අදාළ වන්නේ,
   1. ශුද්ධ වූ ලූක් තුමා ය.
   2. ශුද්ධ වූ ජොහාන් තුමා ය.
   3. ශුද්ධ වූ පාවුලු තුමා ය.
   4. ශුද්ධ වූ මාක් තුමා ය.

05. කාර්ය බහුලත්වය නිසා කිතුනු සංඝ බැහැදකීමේ අපහසුවෙන් ලියැවුන ශුද්ධ වූ පාවුලු තුමාගේ හසුන් වල අන්තර්ගත වන්නේ,
   1. අභිධර්මය හා යුගාන්තික උපදෙස් ය.
   2. පවුල හා ගෝත්‍රික උපදෙස් ය.
   3. පොදු උපදෙස් ය.
   4. දේවධාර්මික හා එඬේරික උපදෙස් ය.

06. 1 තිමති, 2 තිමති, තීතස් යන පොත් අයත් වන්නේ,
   1. කතෝලික සංදේශ වලටය.
   2. ආරූඪ කතෘත්වයෙන් ලියූ හසුන් වලටය.
   3. ද්විතීය පාවුලු සංදේශවලට ය.
   4. විශ්ව සංදේශ වලට ය.

07. පීඩන යුගයක සැදැහැවතුන් දිරි ගැන්වීම සඳහා ලියා ඇති කෘති හඳුන්වන්නේ,
   1. එළිදරව් සාහිත්‍ය කෘති ලෙස ය.
   2. විශ්ව හසුන් ලෙස ය.
   3. සංදේශ හෙවත් හසුන් ලෙස ය.
   4. ප්‍රඥා සාහිත්‍ය කෘති ලෙස ය.

08. දෙවියන් වහන්සේගේ මාර්ගයේ හැසිරෙන විට ආයුෂ වැඩි කරන බවට ප්‍රකාශ කරන්නේ,
   1. දාවිත්ට ය.
   2. සාවුල්ට ය.
   3. සලමොන්ට ය.
   4. සාමුවෙල්ට ය.

09. ජෝබ් සහ ධර්මදේශකයා ග්‍රන්ථ අයත් වන්නේ,
   1. පවුල හා ගෝත්‍රික ප්‍රඥාවට ය.
   2. රාජ්‍ය සහා ප්‍රඥාවට ය.

3. අභිධාර්මික ප්‍රඥාවට ය. 4. ජීවිතය සම්බන්ධ ප්‍රඥාවට ය.

10. ජේසුස් වහන්සේගේ පසුපසින් උත්තම පූජකයාගේ මැඳුර වෙත ගමන් කළේ,
1. පේදුරු ය. 2. මරියතුමිය ය. 3. සිරේනියේ සීමොන් ය.4. අරමාතියේ ජොසප් ය.

11. ජේසුස් වහන්සේව සරදමට ලක්කොට විචිත්‍ර වස්ත්‍රයක් හඳවන ලද්දේ,
1. හෙරෝද් විසිනි. 2. පිලාත් විසිනි. 3. අන්නාස් විසිනි 4. කයිපාස් විසිනි.

12. උපස්ථායකයින් පත්කිරීම කාලෝචිත වූයේ කුමන සේවාවක් සඳහා ද?
1. යාච්ඤා කිරීම 2. ඉගැන්වීම. 3. සුබ අස්න දෙසීම. 4. සහනාධාර බෙදා දීම.

13. තුන්වන ධර්මදූත චාරිකාවෙන් පසු පාවුලු තුමා නැවතී සිටියේ,
1. සිරියාවේ අන්තියෝකියේ ය. 2. ජෙරුසලම් නගරයේ ය.
3. තෙසලෝනිකයේ ය. 4. මසිදෝනියේ ය.

14. පේදුරුතුමාගේ මහා ප්‍රකාශයෙන් පසු ජේසුස් වහන්සේ කළ ප්‍රකාශය,
1. ඔබ ශුද්ධ සභාවේ අත්තිවාරමය 2. ස්වර්ගයේ යතුර බාර දෙමි
3. ඔබ ඉතා භාග්‍යවන්තය 4. ඔබ මිනිසුන් දිනනු ඇත.

15. A සරල හා චාම් ජීවිතයක් ගත කිරීම.
B සමාජ සාධාරණත්වය උදෙසා ඇප කැප වීම.
C ග්‍රන්ථ ගණනාවක් රචනා කර ඇත.
D ශුද්ධවර දෙවන ජුවාම් පාවුලු මුනිතුමන් විසින් කාදිනල් ධූරයට ඔසවන ලදී.
ඉහත සඳහන් ප්‍රකාශ අදාළ වන්නේ,
1. අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පාප්තුමාට ය.
2. මැක්ෂි මිලියම් කෝල්බේ මුනිතුමාට ය.
3. හයවන පාවුළු පාප් වහන්සේටය.
4. ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාට ය.

16. ක්‍රිස්තුන් වහන්සේ ශුද්ධ සභාව තුළ විද්‍යමාන වීම හේතුවෙන් එහි දක්නට ලැබෙන ලක්ෂණය වන්නේ,
1. අපෝස්තලිකත්වය යි. 2. සාධාරණත්වය යි.
3. ශුද්ධත්වය යි. 4. ඒකත්වය යි.

17. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට පංගුකාර වන සියලු දෙනා ජීවත් වන්නේ,
1. ශුද්ධ සභාව තුළ ය. 2. තම ආත්මය තුළ ය.
3. අන්‍යයන්ගේ හදවත් තුළ ය. 4. ක්‍රිස්තුන් වහන්සේ තුළ ය.

18. ක්‍රිස්තුන් වහන්සේ අප හා සමග සදහටම ජීවත් වීම සඳහා
1. මිනිසත්බව ගත් සේක. 2. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළ සේක.
3. මරණය වැළඳ ගත් සේක. 4. ශුද්ධ සභාව ස්ථාපිත කළ සේක.

19. දෙව්මවුට ඇති භක්ති ආදරය නිසාම නමෝ මරිය උච්චාරණය කරමින් ජීවිතක්ෂයට පත්වූයේ
1. ශුද්ධ වූ ජුවාම් පාවුළු පාප්තුමා ය. 2. මයිකල් රුද්‍රිගු පියතුමාය.
3. මැක්ෂිමිලියම් කෝල්බේ මුනිතුමා ය. 4. 13 වන ලියෝ පාප්තුමාය.

20. ''නුඹේ උපතට පෙර මම නුඹ කැප කළෙමි'' ජාතීන් හට දිවැසිවරයකු ලෙස මම නුඹ පත් කළෙමි.'' මෙම ප්‍රකාශය අදාළ වන දිවැසිවරයා
1. ආමෝස් ය. 2. යෙසායා ය. 3. එසකියල් ය. 4. ජෙරමියා ය.

21. ජෝසප්ගේ විපත සමිදාණන් වහන්සේ ජයග්‍රහණයකට හැරවූයේ ඔහු තුළ තිබූ
1. නිර්දෝශී පිරිසිදු නිර්මල බව නිසාය. 2. දයාව කරුණාව හා ඉවසීම නිසාය.
3. සරල චාම් පිරිසිදු චරිතය නිසාය. 4. නිර්දෝශී, අවංක බව නිසා

22. මතෙව් සුවිශේෂයට අනුව දෙවියන් වහන්සේව දකීමට භාග්‍යවන්තයන් වන්නේ,
   1. දයාව ඇත්තෝ ය.  2. නිර්මල සිත් ඇත්තෝ ය.
   3. පොරොන්දු ඉටුකරන අය ය.  4. දුක් වේදනා ඉවසන අය ය.

23. දෙවියන් වහන්සේට බොරු කිරීම නිසා භයානක විනිශ්චයකට මුහුණ දෙනු ලැබුයේ
   1. කායින් සහ ආබෙල් ය.  2. ආදම් සහ ඒව ය.
   3. අනනියස් හා සපිරා ය.  4. අන්නා හා සිමියොන් ය.

24. සත්‍යවාදීව ජීවත් වීමේදී අප නිතරම ඉඩදිය යුත්තේ,
   1. සභා නීතියට ය.  2. රටේ පවතින නීතියට ය.
   3. හෘද සාක්ෂියට ය.  4. සමාජ චාරිත්‍රවලට ය.

25. ඉරුදින ජන වන්දනා වසර තුනේදී දිව්‍ය පූජාව තුළ භාවිතා වන සුවිශේෂ වන්නේ,
   1. මතෙව්, මාක්, ලූක් ය.  2. මතෙව්, මාක්, ජොහාන් ය.
   3. ලූක්, මාක්, ජොහාන් ය.  4. මතෙව්, ලූක්, ජොහාන් ය.

26. සැබෑ ජීවිත පෙරළියක් අත්දකින්නට අපට ආරාධනා කරන්නේ,
   1. චතාරික සමයේ ය.  2. නත්තල් සමයේ ය.
   3. ආගමන සමයේ ය.  4. පාස්කු සමයේ ය.

27. ජන වන්දනා වසරේ ප්‍රධානතම හා ප්‍රථම මංගලෝත්සවය
   1. ක්‍රිස්තෝත්පත්ති මංගල්‍යයයි.  2. ප්‍රසාද ස්නාපන මංගල්‍යයයි.
   3. ක්‍රිස්තෝත්ථාන මංගල්‍යයයි.  4. පෙන්තකොස්ත මංගල්‍යයයි.

28. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දූත මෙහෙවර කැටිකර ඇත්තේ
   1. භාග්‍ය අට තුළ ය.  2. දේව පනත් තුළ ය.
   3. පරමණ්ඩල යාච්ඤාව තුළ ය.  4. උත්තම පූජක යාච්ඤාව තුළ ය.

29. මල් උයනේ යාච්ඤාව මගින් අපට ඉදිරිපත් කරන ප්‍රබල පණිවිඩය වන්නේ,
   1. දුක් වේදනා වලදී පමණක් යාච්ඤා කළ යුතු බව ය.
   2. ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවකදී ම යාච්ඤාවෙන් සූදානම් විය යුතු බව ය.
   3. අභියෝගවලට නිර්භීතව මුහුණ දියයුතු බව ය.
   4. අන්‍යයන්ගේ ගැරහුම් ඉවසා දරා ගත යුතු බව ය.

30. ඊශ්‍රායෙල් ජනතාවගේ කාන්තාර ගමන ගැන ලියැවී ඇති පැරණි ගිවිසුම් ග්‍රන්ථය,
   1. ගණන් කථාව ය.  2. වංශාවලිය ය.  3. වීරාවලිය ය.  4. ලෙවී ව්‍යවස්ථාව ය.

31. ජාකොබ්තුමා බෙතෙල්හි දුටු දර්ශනය අයත් වන්නේ,
   1. යාවේ සම්ප්‍රදායට ය.  2. පූජක සම්ප්‍රදායට ය.
   3. ද්විතීය නීති සම්ප්‍රදායට ය.  4. එලොහිම් සම්ප්‍රදායට ය.

32. නව ගිවිසුමේ කතුවරුන් තම ග්‍රන්ථ ලේඛනගත කිරීමේ දී බොහෝ විට භාවිතා කර ඇත්තේ,
   1. හේබ්‍රෙව් පිටපත ය.  2. ජුදා පිටපත ය.
   3. ග්‍රීක පිටපත ය.  4. මැසරොටික් පිටපත ය.

33. සෙරාප්වරුන් විසින් ගිනි අගුරකින් තොල් පවිත්‍ර කරනු ලැබූ දිවැසිවරයා වන්නේ,
   1. එලියා ය.  2. එසකියල් ය.  3. ජෙරමියා ය.  4. යෙසායා ය.

34. ජුදෙව්වරුන් බලාපොරොත්තු වූ මෙසියස් වන්නේ ක්‍රිස්තුන් වහන්සේ බව අවධාරණය කරනු ලබන්නේ
   1. ශුද්ධ වූ මාක්තුමා ය.  2. ශුද්ධ වූ ලූක් තුමා ය.
   3. ශුද්ධ වූ මතෙව් තුමා ය.  4. ශුද්ධ වූ ජොහාන් තුමා ය.

35. ප්‍රාග් ඉතිහාසය තුළ ඉදිරිපත් කරන ප්‍රධාන දේව ධාර්මික පණිවුඩය වන්නේ,
  1. දෙවියන් වහන්සේ ලෝකයේ මැවුම්කරුවාණන් බවය.
  2. ඓතිහාසික කරුණු ගවේෂණය කළ යුතු බව ය.
  3. දෙවියන් වහන්සේ ලෝකය මැවූ ආකාරයය.
  4. විශ්වය හා මිනිසා ඇතිවූ ආකාරය පිළිබඳ ඉගැන්වීම ය.

36. මැවිල්ල දින හතකට සීමාකර ඇත්තේ,
  1. ජනවන්දනාත්මක රාමුවක් තුළ ධාර්මික අර්ථකථනයකිනි.
  2. යාවේ සම්ප්‍රදාය තුළ දේව ස්වභාවයෙනි.
  3. මැවීම පිළිබඳ පළමු කතාවේ පණිවුඩය තුළිනි.
  4. මිනිස් දුබලතා ලෝකයට ප්‍රකාශ වන අයුරිනි.

37. A ''පොළවට සාප වේවා''
  B ''පොළවෙන් නුඹ නෙරපා දමනු ඇත''
  C ''නුඹට වනයේ පලා කන්නට සිදුවන්නේය.''
  D ''දූවිල්ලෙන් වූ නුඹ දූවිල්ලටම යන්නෙහි ය''
  ඉහත ප්‍රකාශ අතරින් ආදම්ට අදාළ ප්‍රකාශන වන්නේ,
  1. A B C ය. 2. A C D ය. 3. A B D ය. 4. B C D ය.

38. මෙළොව වර්ධනය කළ පාපය ඉවත් කර නව ලොවක ආරම්භය ඇති කිරීමට කැඳවීම ලැබුවේ,
  1. ආදම් ය. 2. ආබ්‍රහම් ය. 3. නෝවා ය. 4. ආබෙල් ය.

39. ආබ්‍රහම්ගේ පෙළපත මිසරය තුළ වර්ධනය වූයේ,
  1. මිසර රජතුමාගේ අනුග්‍රහයෙනි. 2. පාරාවෝ වරුන්ගේ ආධාරයෙනි.
  3. මෝසෙස් තුමාගේ මග පෙන්වීමෙනි 4. පොතිපර්ගේ අනුග්‍රහයෙනි.

40. දෙවියන් වහන්සේ මෝසෙස් තුමාට කැඳවීම දුන් අවස්ථාවේ ඔහු දිරිමත් කරනු ලැබුවේ කවර ප්‍රකාශයකින් ද?
  1. ''නුඹේ පියාගේ දෙවියන් මම වෙමි'' 2. ''මම නුඹ සමග සිටිමි.''
  3. ''පාරාවෝ නුඹට සවන් නොදෙනු ඇත.'' 4. ''ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ මමය''

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

14 S II

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : ....................................... කතෝලික ධර්මය - II

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (i) නව ගිවිසුමේ වෙනත් හසුන් ලියූ ක්‍රිස්තුන් වහන්සේගේ අපෝස්තුලුවරු දෙදෙනෙක් නම් කරන්න.
(ii) එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ දෙකක් ලියන්න.
(iii) ප්‍රඥා සාහිත්‍යයේ අරමුණු දෙකක් ලියන්න.
(iv) මැක්ෂිමිලියම් කෝල්බේ මුනිතුමා ආරම්භ කළ සංවිධානය හා මෙම සංවිධානය ලොව පුරා පැතිරවීමට මහෝපකාරී වූ සඟරාව නම් කරන්න.
(v) හතරවන හා පස්වන පනත් අපට අවධාරණය කරන කරුණු දෙක ලියන්න.
(vi) පංච පුස්තකයට අයත් මුල් ග්‍රන්ථ දෙක ලියා දක්වන්න.
(vii) ජේසුස් වහන්සේ තෝරාගත් පළමු ශ්‍රාවකයන් අතරින් සෙබදීගේ හා සලෝමිගේ පුතුන් දෙදෙනා නම් කරන්න.
(viii) දෙවියන් වහන්සේ ජෙරමියා දිවැසිවරයාට භාරදුන් කාර්යයන් දෙකක් ලියන්න.
(ix) මිනිසාගේ උතුම්කම විද්‍යමාන වන කරුණු දෙකක් ලියන්න.
(x) ශුද්ධ ලියවිල්ලේ උත්පත්ති 3:6 ට අනුව ස්ත්‍රියගේ රුචිය කතා කළ ආකාරයෙන් ඉස්මතු වන යෙදුම් දෙකක් ලියන්න.

02. (i) ජීවන සහා සම්ප්‍රදාය තුළ ඉස්මතු වන කරුණු දෙකක් ලියන්න.
(ii) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත සකස් වීමට පදනම් වූ කරුණු තුනක් ලියන්න.
(iii) මුල් කිතුනු සංඝය තුළ වූ ගුණාංග ඔබගේ පන්ති කාමරයේ ක්‍රියාවට නැංවීමට හැකි ආකාර පහක් ලියා දක්වන්න.

03. (i) සාවුල්ගේ ජීවිතය වෙනසකට යොමු කළ පුද්ගලයා හා නගරය නම් කරන්න.
(ii) ශුද්ධ වූ පාවුලු තුමාගේ ජීවිතයේ අවසාන කාලයේ මුහුණ දුන් අභියෝග තුනක් ලියන්න.
(iii) පියාණන් වහන්සේට ප්‍රශංසා කරන පිණිස අපගේ යහපත් ක්‍රියාවල ආලෝකය අන් අය ඉදිරියෙහි බබළවන්නේ කෙසේද යන්න කරුණු පහකින් ලියා දක්වන්න.

04. (i) පළමු පනතට පදනම් වන දේව ධර්ම ගුණ දෙකක් ලියන්න.
(ii) පොරොන්දු දෙනු ලබන ප්‍රසාද නිධාන තුනක් නම් කරන්න.
(iii) ඒක දේව විශ්වාසය තුළ පළමු පනත් තුන ආරක්ෂා කිරීමට ඔබ ක්‍රියාකරන ආකාර පහක් ලියන්න.

05. (i) ද්විතීය සම්මත ග්‍රන්ථ දෙකක් ලියා දක්වන්න.
(ii) ද්විතීය සම්මත ග්‍රන්ථ දේවානුභාවයෙන් ලියැවී ඇති බවට සාක්ෂි තුනක් ඉදිරිපත් කරන්න.
(iii) ඔබගේ මීසම් සංඝය තුළ අර්ථාන්විත ජනවන්දනාවක් පැවැත්වීමට ගතහැකි ක්‍රියා මාර්ග පහක් ලියන්න.

06. (i) වරදට වැටුණ ඒව හා කායින්ගෙන් දෙවියන් වහන්සේ අසන ලද ප්‍රශ්න දෙක වෙන වෙනම ලියන්න.
(ii) රුචියට වහල් වී ඒව විසින් ගනු ලැබූ වැරදි තීරණ තුළින් අපට ලැබෙන පණිවුඩ තුනක් ලියන්න.
(iii) රුචියට වහල් වී ගනු ලබන වැරදි තීරණ නිසා තම ජීවිත විනාශ කර ගන්නා වත්මන් තරුණ පරපුරට දිය හැකි මඟ පෙන්වීම් පහක් කෙටියෙන් විස්තර කරන්න.

07. **පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.**
(i) ශුද්ධ වූ ලූක්තුමා
(ii) ශුද්ධ වූ මරියගොරිත්ති තුමිය
(iii) පොරොන්දු හා බාරහාර
(iv) සීනයි ගිවිසුම

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

14 | S | I-II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

### කතෝලික ධර්මය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 1 | 21. | 1 | 31. | 4 |
| 02. | 4 | 12. | 4 | 22. | 2 | 32. | 3 |
| 03. | 2 | 13. | 2 | 23. | 3 | 33. | 4 |
| 04. | 3 | 14. | 3 | 24. | 3 | 34. | 3 |
| 05. | 4 | 15. | 1 | 25. | 1 | 35. | 1 |
| 06. | 2 | 16. | 2 | 26. | 3 | 36. | 1 |
| 07. | 1 | 17. | 4 | 27. | 3 | 37. | 2 |
| 08. | 3 | 18. | 2 | 28. | 4 | 38. | 3 |
| 09. | 3 | 19. | 3 | 29. | 2 | 39. | 1 |
| 10. | 1 | 20. | 4 | 30. | 1 | 40. | 2 |

### II කොටස

01. (i) පේදුරු, ජොහාන්, ජූදා, ජාකොබ්
(ii) ද්විත්වවාදය, යුගාන්තවාදය, සංකේත භාවිතය, ආරූඪ නාමයකින් ඉදිරිපත් කර තිබීම.
(iii) ධර්මිෂ්ඨව හා නිවැරදි ලෙස දිවි ගෙවීමට දේව ජනතාව උනන්දු කරවීම. දෙවියන් වහන්සේට ප්‍රිය මනාප දිවියක් ගත කිරීමට
(iv) මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව, වීර සෙබලා සඟරාව
(v) 4 - මව්පියන්ට සංග්‍රහ කිරීම 5 - ජීවිතය විනාශ නො කිරීමට
(vi) උත්පත්ති, නික්මයාම
(vii) ජොහාන් හා මහා ජාකොබ්
(viii) උදුරන්නට හා කඩා දමන්නට, නැති කරන්නට හා හෙළා දමන්නට, ගොඩනඟන්නට හා සිටුවන්නට
(ix) බුද්ධිය, නිදහස් කැමැත්ත, අමරණීය ආත්මය
(x) ගස කෙතරම් රමණීය ද? ඵල කොතරම් ප්‍රණීත ද? නුවණ වැඩුමට කොතරම් කදිම ද?

02. (i) අපෝස්තුලුවරුන්ගේ සිට පැවත එන ඉගැන්වීම් අන්තර්ගත වේ.
කතෝලික සභාවේ අනන්‍යතාව මැනවින් විදහා දක්වයි.
(ii) ධර්මදූත සේවයට සූදානම, ජෙරුසලමෙහි සාක්ෂි දැරීම, ජුදයේ හා සමාරියේ සාක්ෂි දැරීම, ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්මදූත සේවය.
(iii) යාච්ඤා කිරීම, සියල්ල පොදුවේ තබා ගැනීම, බෙදා හදා ගැනීම වැනි ගුණාංග ඉස්මතු කරමින් ඇති කරුණු සලකා ලකුණු දෙන්න.

03. (i) අනනියස්, දමස්කස් නගරය
(ii) දේව මාලිගාවේදී අත් අඩංගුවට ගැනීම, කිහිප දෙනෙකුගේ විනිශ්චයට ලක් වීම, සිරකරුවකු ලෙස රෝමයට ගෙන යාම.

04. (i) විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රේමය
(ii) ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය, ආශිර්වාදකාර බන්ධනය
(iii) ලියා ඇති කරුණු සලකා බලා ලකුණු දෙන්න.

05. (i) තෝබිත්, ජූදිත්, සලමොන්ගේ ප්‍රඥාව, උපදේශකයා, බාරුක්, 1 මකබ් 2 මකබ්
(ii) නව ගිවිසුමේ කතුවරුන් තම ග්‍රන්ථ ලේඛන ගත කිරීමේ දී ග්‍රීක පිටපත භාවිත කිරීම (උපුටා ගැනීම් 350න් 300 ග්‍රික පිටපත) ග්‍රීක පිටපත තුළ සම්මත හා ද්විතිය සම්මත ග්‍රන්ථ වෙන් වෙන්ව දක්වා නො තිබීම. මුල් කිතුනු සභාව තුළ ද්විතිය සම්මත ග්‍රන්ථය ජන වන්දනාව සඳහා භාවිතා කිරීම.
(iii) ලියා ඇති කරුණු සලකා ලකුණු ලබා දෙන්න.

06. (i) ඒවගෙන් - ''නුඹ මෙය කළේ මන්ද?''
කායින්ගෙන් - ''නුඹේ සහෝදර ආබෙල් කොහේද?''
(ii) රුචියට වහල් වී වැරදි තීරණ ගැනීම නුසුදුසු බව, තීරණ ගැනීමේ දී හෘද සාක්ෂියට සවන් දී එයට අවනත විය යුතු බව, දේව අභිමතයට පූර්ණ නිදහසින් අවනත විය යුතු බව.

07. (i) පොරොන්දු හා බාරහාර 10 පෙළපොත 68 පිටුව
(ii) ශුද්ධ වූ මරිය ගොරෙන්ති තුමිය - 10 පෙළපොත 89 පිටුව
(iii) ශුද්ධ වූ ලූක් තුමා - 11 පෙළ පොත 14, 15 පිටු
(iv) සීනයි ගිවිසුම - 11 පෙළ පොත 35 පිටුව

### ලකුණු ලබා දීම

I පත්‍රය ලකුණු 40

II පත්‍රය

| | |
|---|---|
| පළමු ප්‍රශ්නය සඳහා | = 10 × 2 = 20 |
| දෙවන ප්‍රශ්නය - 6 ප්‍රශ්නය | = 2 + 3 + 5 = 10 |
| හත්වන ප්‍රශ්නය | = 5 + 5 = 10 |